112876
01
18.9.90

# සිංහල ගීත පදමාලා සම්ප්‍රදාය

(විෂය ක්ෂේත්‍රය සහ පරිණාමය / ආරම්භයේ සිට ක්‍රි.ව. 1947 දක්වා)

CR
ලංකා
ශාලාව

සුනිල් ආරියරත්න

දර්ශන ශුරි උපාධිය සඳහා
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට ඉදිරිපත් කළ
නිබන්ධය යි
1982

112876

# සා රා ං ශ ය

සිංහලයේ ගද්‍යයෙන් පරිබාහිර රචනා විශේෂ රාශියකි. ප්‍රථම පරිච්ඡේදයෙන් තෙරෙන්නේ පර්යේෂණයෙහි පශ්චාත් භූමිය සැකසීම් වස් ඒ ඒ රචනාවන්හි සංඥා නාම, නිර්වචන සහ කෙටි විස්තර ඉදිරිපත් කිරීමකි.

ද්විතීය පරිච්ඡේදය වෙන් වී ඇත්තේ සමස්ත සිංහල පද්‍ය සාහිත්‍යය ම හුදු නිහඬ කියවීමකට නො ව ගායනා කිරීමකට උචිත ලෙස රචනා වී තිබෙන බව ස්ඵුට කිරීමට යි.

නච්ච – ගීත – වාදිතාදී ලලිත කලාවෝ ප්‍රාකෘතික ථෙරවාද බුද්ධ ධර්මය අනුදත් විෂයයෝ නො වෙති. එහෙත් පුරාතන ලංකාවේ නැටුම, ගැයුම, වැයුම භජනය කළ අද්විතීය ස්ථානය, සම්භාව්‍ය සිංහල සාහිත්‍යාගත තොරතුරුවලින් ප්‍රතීයමාන වන ආකාරය යි තෘතීය පරිච්ඡේදයෙන් පැහැදිලි තෙරෙන්නේ.

සිවු වැනි පරිච්ඡේදය, සරල ගායන රටාවකට කැඩුණු සිංහල පද්‍යය, භාෂාව – ආකෘතිය – වෘත්ත – තාලරූප විසින් සංකීර්ණත්වයට පත් වී රාජ රාජ මහාමාත්‍යාදීන් අභීප්‍ස සංගීතය මිශ්‍ර ගායනයකට පරිවර්තනය වූ ආකාරය පෙන්වා දෙයි.

රාජකීයයන් ඇසුරේ ගීතය සංකීර්ණත්වයට පත්වෙද් දී එහි ධූල සම්ප්‍රදාය ශ්‍රම සැහැලි, ශාන්ති කර්ම, ක්‍රීඩා, නැටුම් ආදියෙහි එල්බගෙන ස්ථිතික ව පැවති ආකාරය පස් වැනි පරිච්ඡේදයෙන් විස්තර වෙයි.

ආරම්භයේ පටන් විවිධ ප්‍රවණතාවන්ට භාජනය වෙමින් ගා යනය සඳහා සැදී පැහැදී සිටියේ පද්‍යය යි. එහෙත් සිංහල සින්දුවේ වැඩියාමත් සමග සින්දුව අසන්නන්ටත් පද්‍යය කියවන්නන්ටත් වෙන් වී දෙ මංතලාවක ගමන් කරන්නට විය. ස වැනි පරිච්ඡේදයෙන් විස්තර වන්නේ මේ සංක්‍රාන්ති සමය යි.

සින්දුව ද විවිධ විපර්යාසයන්ට භාජනය විය; ලක්දිව නාටක කලාව ඇසුරෙහි එය ජනප්‍රිය වූ ද ප්‍රබල වූ ද වාණිජ්‍ය මෙවලමක් විය; යුරෝපීය ජාතීන්ගේ පාලන සමයෙහි තවත් සින්දු විශේෂ මෙ රටට සංක්‍රමණය විය. හත් වැනි පරිච්ඡේදයෙහි ඒ විස්තර සටහන් වෙයි.

අට වැනි පරිච්ඡේදය වෙන් වන්නේ නා ට්‍ය කලාව විසින් ජනප්‍රියත්වයට පත්කරන ලදු ව අවසානයෙහි නාට්‍ය කලාවෙහි ජනප්‍රියත්වයට හේතුභූත වූ සින්දුව, තාක්ෂණික උපකරණයක් වූ ග්‍රැමෆෝන් තැටියට සම්ප්‍රාප්ත ව ගද්‍යයෙන් පරිබාහිර සියළු රචනා විශේෂ අබිභවමින් ශ්‍රොතෘ ජනයා ආනන්දයට පත් කළ සැටිත් තවත් තාක්ෂණික උපකරණයක් වූ ගුවන් විදුලියෙහි ආගමනය නිසා ග්‍රැමෆෝන් තැටි යුගය, නව කාල පරිච්ඡේදයකට අවතීර්ණ වන සැටිත් පහදා දීමට යි.

# පටුන

සාරාංශය

මූලාශ්‍ර හා ක්‍රම විද්‍යාව පිළිබඳ සටහනක්

අනුමෝදනා

පටුන

සංකේත නිරූපණ

පළමු වැනි පරිච්ඡේදය

| | |
|---|---|
| ගීත පදමාලාව යනු කුමක් ද? | 01 - 24 |

දෙ වැනි පරිච්ඡේදය

| | |
|---|---|
| පද්‍යය සහ ගායනය | 25 - 57 |

තෙ වැනි පරිච්ඡේදය

| | |
|---|---|
| නැටුම් ගැයුම් වැයුම් පිළිබඳ සාහිත්‍යාගත තොරතුරු | 58 - 120 |

සිව් වැනි පරිච්ඡේදය

| | |
|---|---|
| පද්‍යයෙන් ගීතයට | 121 - 177 |

පස් වැනි පරිච්ඡේදය

| | |
|---|---|
| ජන ගී | 178 - 250 |

ස වැනි පරිච්ඡේදය

| | |
|---|---|
| ගීතයෙන් සින්දුවට | 251 - 348 |

සත් වැනි පරිච්ඡේදය

| | |
|---|---|
| සින්දුවේ ප්‍රවණතා | 349 - 463 |

අට වැනි පරිච්ඡේදය

| | |
|---|---|
| ග්‍රැමෆෝන් තැටි යුගය | 464 - 541 |
| නිගමනය | 542 - 543 |
| ආශ්‍රිත ග්‍රන්ථ | 544 - 564 |